# අධ්‍යාපන අමාත්‍යාංශය

## දිවයින පුරා පිහිටි ජාතික පාසල්වල පුරප්පාඩු වී ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම - 2023

මේ සමඟ ඇති උපලේඛනයේ සඳහන් ජාතික පාසල්වල විදුහල්පති තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසු නිලධාරීන් තෝරා පත් කර ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සුදුසුකම්**

i. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙක් වීම.

**සටහන 1:** අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පෙර ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස්වීම් ලැබීමට සුදුසුකම් ලබා ඇති නිලධාරීන්ට පමණක් මෙම පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකි අතර, නියමිත උසස්වීම් ලැබීම සඳහා සුදුසුකම් සපුරා නොමැති නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේදී 1 ශ්‍රේණියට උසස්වීම් ලද ලිපිය ඉදිරිපත් කළ යුතුය.)

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ අධ්‍යාපන සේවා කමිටුව විසින්, ජාතික පාසල් විදුහල්පතිවරු ලෙස පත් කිරීමට නුසුදුසු බවට දන්වා ඇති නිලධාරීන්ට අයදුම් කළ නොහැකිය.

iii. අයදුම්කරුවන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 58 ට නොවැඩි විය යුතුය. (දැනටමත් යම් ජාතික පාසලක විදුහල්පති තනතුරේ වැඩ බැලීමට/ රාජකාරි ඉටුකිරීමට/ රාජකාරි ආවරණය කිරීමට විධිමත්ව පත්කර ඇති නිලධාරීන්ට එම විදුහල්පති තනතුරටම ඉල්ලුම් කිරීම සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.)

**02. කොන්දේසි**

**i. මෙවර පුරප්පාඩු පිරවීමේදී අදාළ විදුහල්පති තනතුරු සඳහා පත්වීම් ලබන නිලධාරීන් එම තනතුරේ අවම වශයෙන් වසර 3 ක් වත් සේවය කළ යුතු ය.**

**ii. මනාපය පල කරන ලද ඕනෑම පාසලක විදුහල්පති තනතුරට පත්වීම් ලදහොත් පිළිගත හැකි සාධාරණ හේතු නොමැතිව එම තනතුරේ රාජකාරී භාර ගැනීම ප්‍රතික්ෂේප කළ නොහැක.**

**03. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය**

i. අයදුම්කරුවන් විසින් මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, ලියාපදිංචි තැපෑලෙන් පමණක් පහත දැක්වෙන ලිපිනයට 2023.04.28 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. ඉල්ලුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ජාතික පාසල් විදුහල්පති තනතුර - ශ්‍රී ලං.අ.ප.සේ. – I"** යන්න සඳහන් කොට තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් **"සහකාර ලේකම්, අධ්‍යාපන සේවා ආයතන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල"** යන ලිපිනයට යොමු කළ යුතුය.

ii. ඔබගේ මෑතකදී ලබා ගන්නා ලද අඟල් 2x2½ වර්ණ ඡායාරූපයක් අයදුම්පතේ දකුණු පස ඉහළ කෙළවරෙහි අලවා එවිය යුතු වේ.

04. ක්‍රමවේදය

පාසල් පදනම් කරගනිමින් විදුහල්පතිවරු ලෙස නිලධාරීන් තෝරා නොගන්නා අතර, පුරප්පාඩු පවතින පාසල් සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විදුහල්පතිවරු ලෙස පත් කිරීම සඳහා තෝරා ගනු ලැබේ.

කෙසේ වෙතත් අයදුම්පත් යොමු කිරීමේ දී අයදුම්කරුවන්ට තම මනාපය පරිදි පාසල් නම් කළ හැකි අතර, විදුහල්පති තනතුරට පත් කිරීමේදී එම මනාපය ද සළකා බලනු ලැබේ.
ඒ අනුව, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් අනුමත කරන ලද මේ සමඟ දක්වා ඇති ලකුණු පටිපාටියට අනුව, එම කමිටුව විසින් පත් කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ලබා දෙනු ලබන ලකුණු, අයදුම්කරුගේ මනාපය, අයදුම්කරු සම්බන්ධයෙන් පැවති/පවතින විනය කටයුතු, සහ සලකා බැලිය යුතු වෙනත් කරුණු ද සැලකිල්ලට ගනිමින් අධ්‍යාපන ලේකම් විසින් ලබාදෙන නිර්දේශයන් මත පදනම්ව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් විදුහල්පති තනතුරු සඳහා සුදුසු නිලධාරීන් පත්කරනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි,

**එම්.එන්.රණසිංහ**
**ලේකම්**
**අධ්‍යාපන අමාත්‍යාංශය**

2023.04. 11